සැ. යු. - 2015.06.19 වැනි දින පළ වූ අංක 1,920 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,921 - 2015 ජුනි මස 26 වැනි සිකුරාදා - 2015.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1086 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1087 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1088 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1095 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1096 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට ට්‍රැක් බැලස්ට් කියුබ් 10,000ක් (10,000 Cubes of Track Ballast) සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

01. කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි සභාපති විසින් පහත සඳහන් ස්ථාන සඳහා ට්‍රැක් බැලස්ට් (Track Ballast) සැපයීම සඳහා 2015.07.14 වැනි දින ප. ව. 2.00 තෙක් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන්ව ඇගයීමට ලක්කර ප්‍රදානය කරනු ලැබේ.

| *අයිතම අංකය* | *ස්ථානය* | *කියුබ්* | *ගෙනැවිත් භාරදිය යුතු කාල සීමාව* |
|---|---|---|---|
| 01. | පාලවි දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 02. | මුන්දලම දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 03. | පුත්තලම දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 04. | බංගදෙනිය දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 05. | මදුරන්කුලිය දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 06. | කුඩා වැව දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 07. | කාක්කපල්ලිය දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 08. | ලුණුවිල දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 09. | බෝලවත්ත දුම්රිය ස්ථාන අංගනය | 1000 | මාස 06 |
| 10. | කුරණ දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 11. | ජාඇල දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 12. | කොච්චිකඩේ දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 13. | හොරපෙ දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |
| 14. | හුණුපිටිය දුම්රිය ස්ථාන අංගනය | 500 | මාස 04 |

02. ලංසු ආපසු ගෙවනු නොලබන රු. 3,000ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2015.07.13 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාරගැනීම 2015.07.14 වැනි දින ප. ව. 2.00 ට අවසන් වේ.

04. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ සිදුකළ යුතු ය.

සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත,
කොළඹ 10

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

දුරකථන : 2438078/2436818
ෆැක්ස් : 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7230

06- 820

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - වලපනේ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ 2015.07.25 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු වේ.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ පූර්ව අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට විනාඩි 30කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැණුනු අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එවේලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගතයුතු අතර සියලුම ගෙවීම් මුදලින් කළ යුතු වේ. චෙක්පත් භාර ගැනීමක් සිදු කරනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා සෑම පුද්ගලයෙකු ම තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම කළ යුතු ය.

එම්. එච්. ෆරික්ඩීන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
වලපනේ.

2015ක් වූ ජුනි මස 04 වැනි දින,
වලපනේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ විස්තරය

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 59725 | සුදුපාට හිස් කෑන් | 02 |
| | | මිනුම් කරඩි | 03 |
| | | පුනීල | 03 |
| | | අඩි 08 ප්ලාස්ටික් බට කැබලි | 01 |
| 02. | 55018 | අඩි 08 යකඩ ඉනිමග | 01 |
| 03. | 61052 | ඇලුමිනියම් හට්ටි | 02 |
| 04. | 50119 | ප්ලාස්ටික් කලය | 01 |
| 05. | 50216 | සුදුපාට හිස් කෑන් | 01 |
| 06. | 46806 | තඹ දඟර කැබලි | 01 |
| 07. | 47536 | වක් පිහියා | 01 |
| 08. | 47534 | වක් පිහියා | 01 |
| 09. | 56538 | තරාදි | 01 |
| 10. | 38002 | දුනු තරාදි | 01 |
| 11. | 50915 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 12. | 57491 | දුනු තරාදි | 01 |
| 13. | 48236 | යකඩ බට කැබලි | 01 |
| 14. | 59186 | මීටර් කෝදු | 01 |
| 15. | බී/43/13 | වක් පිහියා | 01 |
| 16. | බී/321/13 | පිහියා | 01 |
| 17. | බී/221/13 | පිහියා | 01 |
| 18. | AR/944/14 | වක්පිහියා | 01 |
| 19. | 50486 | උදළු මිට | 01 |
| 20. | 57815 | බැටරි | 01 |
| 21. | 48497 | සවල් | 01 |
| 22. | 51116 | සවල් | 01 |
| 23. | 58839 | වයර් කැබලි | 01 |
| | | ප්ලග් | 01 |
| 24. | AR/422/15 | කැත්ත | 01 |
| 25. | AR/425/15 | වක් පිහියා | 01 |
| 26. | 43871 | ගැරුම් වට්ටි | 01 |
| | | ඉල්ලම් කූරු | 01 |
| | | උදලු | 01 |
| | | සොරඩි | 01 |
| | | ටෙන්ට් රෙදි | 01 |
| | | ඇළුමිනියම් සාස් පාන් | 01 |
| | | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 27. | 41949 | වක් පිහියා | 01 |
| 28. | බී/305/13 | කම්බි කූරු | 01 |
| 29. | | හිස් බෝතල් තොගයක් | |
| 30. | | හිස් කෑන් තොගයක් | |
| 31. | | වැලි තොගයක් | |
| 32. | 56810 | තලය 5 මිට 5 1/2 වක් පිහි | 01 |
| 33. | 47322 | ඇල්කතීන් බට අඩි 67ක් දිග කැබලි 3ක් සහිත බට රෝල් | 01 |
| 34. | 46662 | උදළු | 01 |
| 35. | 54176 | යකඩ මිට සහිත සවල් | 01 |
| | | ලී මිට සහිත උදළු | 01 |
| 36. | 53743 | උල් පිහියා | 01 |
| 37. | 51228 | එස්ලෝන් බට | 20 |
| 38. | 56571 | වක් පිහියා | 01 |
| 39. | 54242 | අලවංගු | 01 |
| 40. | 61822 | සින්තා පැදුරු | 01 |
| 41. | AR 425/15 | වක් පිහි | 01 |
| 42. | AR 422/15 | කැති | 01 |
| 43. | 49403 | වර්ගය සඳහන් නොමැති ජංගම දුරකථන | 01 |
| 44. | 58838 | ඉල්ලම් කූරු | 01 |
| | | මැණික් ගරන කූඩ | 01 |
| 45. | B 207/14 | දුනු තරාදි | 01 |
| 46. | 56245 | මි. මී. 97 ප්‍රමාණයේ වානේ කම්බි | 05 |
| 47. | 53763 | කුඩා ප්‍රමාණයේ තලයක් සහිත උදළු | 01 |
| 48. | 55267 | වක් පිහි | 01 |
| 49. | 54176 | සවල් | 01 |
| | | ලී මිට සහිත උදළු | 01 |
| 50. | ගලවා ඉවත් කරන ලද විනිශ්චයාසන වටා යොදන ලද බිරළු වැට | | |
| 51. | ගරු දිසා විනිසුරු තුමාගේ WPKD 1855 අංක දරන නිල රථයෙන් ඉවත් කරන ලද ටයර් 4ක් | | |
| 52. | ගරු දිසා විනිසුරු තුමාගේ WP - KD 1173 අංක දරන නිල රථයෙන් ඉවත් කරන ලද ටයර් 4ක් | | |

06-799

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මුලතිව්**

අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් නොපාන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම

මුලතිව් මහෙස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ මෙම අධිකරණ භූමිය තුළ 2015.07.01 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිතය.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවකු විසින් හිමිකම් පාන්නේ නම් එම ඉල්ලම වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර මහජනයා විසින් මෙම භාණ්ඩ නැරඹිය හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට තබා ඇති යම්කිසි භාණ්ඩයක අවම ලංසුව නොලැබුණේ නම් වෙන්දේසියේ දී එම භාණ්ඩය ආපසු ලබා ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

05. විකුණනු ලැබූ භාණ්ඩ වලට එවෙලේම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කළ යුතුයි. සෑම ගෙවීමක් ම මුදලින් ම ගෙවිය යුතු වන අතර චෙක්පත් භාර ගනු නොලැබේ. භාණ්ඩ මිල දී ගැනීමට එන අය ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්යයි.

එම්. එස්. එම්. සම්සුදීන්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මුලතිව්.

| *No* | *Make and Model* | *Registration* | *Value Price* |
|---|---|---|---|
| 01. | TVS Star City | MW – 3942 | 6,000 |
| 02. | Yamaha 3PI 0000006 | JJ – 0646 | 8,000 |
| 03. | Hero Honda Passion Plus | JY – 5995 | 4,500 |
| 04. | Yamaha V 50 Mate | 500 – 3320 | 3,500 |
| 05. | Hero Honda Passion Pro | VI – 4448 | 7000 |
| 06. | Bajaj Pulsar | JD – 1631 | 25,000 |
| 07. | Hero Honda CD Dawn | UI – 5279 | 4,000 |
| 08. | Bajaj Pulsar | HG– 4312 | 30,000 |
| 09. | Hero Honda Splendor NXG | XD – 7653 | 8,000 |
| *10. | Hero Honda Passion Plus | | 1,500 |
| *11. | Hero Honda | JU – 9415 | 2,000 |
| *12. | Honda | GN– 1097 | 750 |
| *13. | Bajaj CT 100 | MJ – 3065 | 1,500 |
| *14. | Yamaha Rx 100 | 149 – 2036 | 1,500 |
| *15. | Bajaj Champion | 150 – 5410 | 1,500 |
| *16. | Hero Honda CD 100 SS | GY – 3819 | 1,200 |
| *17. | TVS Victor | | 2,000 |
| *18. | ISUZU | 26– 4610 | 20,000 |

06-610

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු :-

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ග්ලෝබල් බිස්නස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 105697 | 2015.05.19 | අංක 36, කිරුළ පාර, කොළඹ 5. |
| එස් කේ ඉන්වෙස්ට්මන්ට් සොලූෂන්ස් (පී වී ටී) එල් ටී ඩී | පී. වී. 105918 | 2015.05.28 | අංක 305, පුත්තලම් පාර, කුරුණෑගල. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී,
සමාගම් ලේකම්වරු.

06-784

**දැන්වීමයි**

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි කාර්යාලය* | *ලියාපදිංචි කළ දිනය* |
|---|---|---|---|
| පීපල්ස් ක්‍රෙඩිට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 105077 | අංක 07,ජයසෙන්ගම, මොණරාගල. | 2015.05.12 |

ඉහත කී සමාගම වෙනුවෙන් සමාගමේ ලේකම්.

06-764

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් යථා පරිදි ලියාපදිංචි කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කාර්යාලය* |
|---|---|---|
| සොබාකෙම් (පීවීටී) එල්ටීඩී | පීවී 96843 | අංක 125//ජී, නිදහන වත්ත, ඉලුක්වත්ත, පිළිමතලාව |
| හරිත ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) එල්ටීඩී | පීවී 97619 | එම |
| සී ආර් ඉන්වෙස්ට්මන්ට් කම්පණි (පීවීටී) එල්ටීඩී | පීවී 87178 | පනාපොල, කලවාන |
| කුකුලෙගඟ ලේක් වීව් හොටෙල් (පීවීටී) එල්ටීඩී | පී වී 102355 | එම |
| එම්. ආර්. හෙන්රි ඇන්ඩ් කම්පණි (පීවීටී) එල්ටීඩී | පීවී 103523 | අංක 72, මනතුංග මාවත, හෝමාගම |
| ජඉක්ස් ඇසෝසියේට්ස් (පීවීටී) එල්ටීඩී | පී වී 98133 | අංක 60, පමුණුව, මහරගම |
| අයිඩියල් ඩිසයින් ඇන්ඩ් ඉන්ජිනියරින් (පීවීටී) එල්ටීඩී | පී වී 105076 | අංක 316/එෆ්, ගඟ පාර, නාන්දුව, මොරොන්තුඩුව |
| ද ටී බ්‍රීස් (පීවීටී) එල්ටීඩී | පීවී 105089 | අංක 6/6, 37, ගුඩ් හෝප්ස් , සාගර පාර, බම්බලපිටිය |
| මිසුහෝ ග්‍රීන් (පීවීටී) එල්ටීඩී | පී වී 105658 | අංක 28, කොළඹ පාර, බියගම |
| රිචිල් කෙමිකල් ලංකා (පීවීටී) එල්ටීඩී | පී වී 71653 | අංක 169, හේකිත්ත පාර, වත්තල. |

ලේකම්.

06-638

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : කෙන්ට් මීඩියා ඇක්ෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 105703
දිනය : 2015.05.19
ලිපිනය : අංක 02, ඊ. ඩී. දාබරේ මාවත, කොළඹ 05.

ලේකම්.

06-596

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : සැට් නැම් විලේජ් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 105847
දිනය : 2015.06.01
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/311

06-603

**සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : ක්යෝටෝ ඔටෝ ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 105882
සංස්ථාගත කිරීමේ දිනය : 2015 මැයි මස 27
ලියාපදිංචි ලිපිනය : අංක 148, ගාලු පාර, කළුතර උතුර.

සමාගමේ ලේකම්.

06-648

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව දැන්වීමයි**

සමාගමේ නම : අන්කොමන් කලෙක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2015.05.25
ලියාපදිංචි කාර්යාලය : අංක එල් 272, තිස්සපුර, අම්පාර
සමාගම් අංකය : පී වී 105723

ලේකම්.

06-679

---

**නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රොකී ෆැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 105579
සංස්ථාගත කළ දිනය : 2015.04.13
ලියාපදිංචි කාර්යාලය : අංක 543/3, පේරාදෙණිය පාර, මහනුවර.

ලේකම්.

06-669

---

**නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එම් ආර් ඉසෙඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 105371
සංස්ථාගත කළ දිනය : 2015.04.30
ලියාපදිංචි කාර්යාලය : අංක 183/සී/1, නුවර පාර, කහටපිටිය, ගම්පොල.

ලේකම්.

06-670

**නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සල්කා පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 104260
සංස්ථාගත කළ දිනය : 2015.03.04
ලියාපදිංචි කාර්යාලය : අංක 205/1, බංගලාව පාර, මානම්බොඩ, උකුවෙල, මාතලේ.

ලේකම්.

06-671

---

**ප්‍රසිද්ධ නිවේදනය**

මාපැක් ෆිටො සයන්ස් (පීවීටී) එල්ටීඩී 2015 මැයි 11 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මාපැක් ෆිටො සයන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 105325
ලියාපදිංචි කාර්යාලය : අංක 63/1, වෝඩ් පෙදෙස, කොළඹ 7

සහාය කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 23 ඒ 1/1, සුලෙයිමන් ඇවනියු,
කොළඹ 5.

06-674

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

කඳාන, පරණ ඕආර්ඕ මාවත, අංක 99/20 එම් දරන ස්ථානයේ පදිංචි වලගම්එලගේ ජීවන්ති මේනකා සිල්වා වන මම ශ්‍රී ලංකාවේ කඳාන, පරණ ඕආර්ඕ මාවත, අංක 99/20 එම් දරන ස්ථානයේ පදිංචි වලගම්එලගේ කලිස්ටස් සුනිල් සිල්වා යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එන්. එස්. කන්නන්ගර මිය සහතික කළ අංක 187 සහ වර්ෂ 2007.07.29 වැනි දින දරන ඇටර්නි බලය 2015.06.01 වැනි දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු.

06-678

---

**සංස්ථාගත කිරීමේ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : එස් එල් ටී විෂන්කොම් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 63007
සංස්ථාගත කළ දිනය : 2008.02.11
සමාගමේ ලියාපදිංචි ලිපිනය : ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රධාන කාර්යාලය, ලොටස් පාර, තැ. පෙ. 503, කොළඹ 01

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස් එල් ටී විෂන්කොම් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්.

06-680

**සමාගමක නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත දක්වා ඇති සමාගමේ නාමය 2013 මාර්තු මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස්කර තිබේ.

පූර්ව නාමය : මුබාෂර් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
අලුත් නාමය : ඩී එෆ් එන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 5658
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 60, ඩෙව්ඩ්සන් පාර, කොළඹ 04

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-689

---

**තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය පී වී 67189

**සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම**

2015 ජුනි මස 01 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (බී) වගන්තිය යටතේ මෙම සමාගම 2015 ජුනි මස 01 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ඩී. ඒ. ජේ. වර්ණකුලසූරිය,
එස්. සී. මෙන්ඩිස්,
අධ්‍යක්ෂකවරු.

2015 ජුනි 10 වැනි දින.

06-699/1

---

**තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය පී වී 67189

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඈවරකරුවන් පත්කිරීමේ දැන්වීම**

කොළඹ 04, කාසල් පටුමගේ, අංක 02 හි හතරවන මහලෙහි පදිංචි පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් යන අප 2015 ජුනි මස 01 වැනි දින කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවත, පලමු මහල, අංක 35, දරන ස්ථානයේ පිහිටි තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඈවරකරුවන් වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
ඈවරකරුවන්,
තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමටඩ්.

2015 ජුනි මස 10 වැනි දින.
එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
හතරවන මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

06-699/2

---

**නිවේදනය**

වන් ගෝල් ෆේස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමටඩ් 2015 මැයි 20 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වන් ගෝල් ෆේස් ප්‍රොපර්ටි මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102941
ලියාපදිංචි කාර්යාලය : අංක 5, බෙතෙස්ඩා පෙදෙස, ඩික්මන් පාර ඔබ්බෙහි, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

06-704

---

**නිවේදනය**

පාර්ක්විලී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 ජනවාරි 23 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පාර්ක්විලී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101480
ලියාපදිංචි කාර්යාලය : සී 24, ටොරිංටන් මහල් නිවාස, ටොරිංටන් ඇවනියු, කොළඹ 5, ශ්‍රී ලංකාව.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.
පාර්ක්විලී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-705

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ජාඇල, වැවල, මහවත්තේ අංක 23/6, ලිපිනයේ පදිංචි පයාගලගේ නිශාන්ති රන්විල් පෙරේරා වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සෞම්‍යකාන්ති පී ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 3386 සහ 2012.11.07 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් කඩවත, මහර, නුගේගොඩ අංක 447 - එන් ලිපිනයේ පදිංචි වැලිවේරිය මහ විදානගේ විනීතා පෙරේරා යන අයට පවරන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කරමි.

පයාගලගේ නිශාන්ති රන්විල් පෙරේරා.

06-763

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හලාවත, මාදම්පේ, පනිරෙන්ඩාව, මැදගම හි පදිංචි වැවලගේ ඩේසි චන්ද්‍රානි ප්‍රනාන්දු වන මා විසින් මාදම්පේ, පනිරෙන්ඩාව, මැදගම හි පදිංචි රන්දූනු පතිරන්නැහැලාගේ මංගලිකා රන්දූනු වෙත ප්‍රදානය කරන ලද ආර්. ඒ. ලලිත් රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 2010.03.31 දිනැති අංක 6399 දරන ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

වැවලගේ ඩේසි චන්ද්‍රානි ප්‍රනාන්දු.

06-774

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (2) වගන්තිය ප්‍රකාරව ඩොල්ෆින් හොටෙල්ස් පී. එල්. සී. (PQ224) සහ මයාමි බීච් හොටෙල්ස් සමාගම (PB186) ඒකාබද්ධ කිරීම.

මෙහිලා නිවේදනය කරනු ලබන පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ (පනත) වගන්තිය 242(3) (ආ) පරිදි මෙම සමාගම් දෙකෙහි පිළිවෙලින් එක් එක් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද ප්‍රතිධීන් යටතේ ඩොල්ෆින් හොටෙල්ස් (පී. එල්. සී) (ඩොල්ෆින්) PQ224) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සීමාසහිත බීච් හොටෙල්ස් (මයාමි) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පනතේ 242 (2) (ආ) වගන්තිය ප්‍රකාරව මයාමි සහ ඩොල්ෆින් සමාගම ඒකාබද්ධ කිරීමට තීරණය කළේ ය.

ඒකාබද්ධ කරනු ලැබූ සමාගමේ නම ඩොල්ෆින් හොටෙල්ස් පී. එල්. සී. විය යුතු වන අතර 2015 ජුලි මස 31 වැනි දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ලබන එබඳු දිනක සිට මෙම ඒකාබද්ධ කිරීම බලපැවැත්වෙනු ඇත.

පනතේ 242 (4) වගන්තිය ප්‍රකාර ව ඒකාබද්ධ කිරීමේ යෝජනාව ව්‍යවස්ථාපිත කරනු ලැබීම ඒකාබද්ධ කිරීම අනුමත කිරීමේ ප්‍රතිධීන් මගින් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒකාබද්ධ වනු ලබන සමාගමේ ඕනෑම පාර්ශ්වකරුවෙකුට හෝ ණය හිමියෙකුට හෝ ඒකාබද්ධ වනු ලබන සමාගමේ බැඳීමකට යටත් වන වෙනත් ඕනෑම පුද්ගලයෙකුට සාමාන්‍ය ව්‍යාපාරික වේලාවන්හි දී ''හේමාස් හවුස්'' අංක 75, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02 හි දී ඒවා පරික්ෂා කිරීමට හැකි විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සීමාසහිත මයාමි බීච් හොටෙල්ස් සමාගම,
හේමාස් කෝපරේට් සර්විස් (පෞද්.) සමාගම,
ලේකම්වරුන්.

ඩොල්ෆින් හොටෙල්ස් පී. එල්. සී,
හේමාස් කෝපරේට් සර්විස් (පෞද්.) සමාගම,
ලේකම්වරුන්.

06-780

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එදිරිසිංහ ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102211
ලියාපදිංචි කාර්යාලය : ECW පස්යාල ගොඩනැගිල්ල, අංක 175/4, නුවර පාර, පස්යාල
ලියාපදිංචි දිනය : 2014.11.18

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

06-792

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ෆ්ලයිං බර්ඩ් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104517
ලියාපදිංචි කාර්යාලය : අංක 130/3 ඒ, කඩුවෙල පාර, අතුරුගිරිය
ලියාපදිංචි දිනය : 2015.03.18

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

06-793

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එක්ටෝ සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.06.01
සමාගමේ අංකය : පී වී 105988
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 101, රජමහා විහාර පාර, නාවින්න, මහරගම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

06-801

---

## නිවේදනයයි

ට්‍රැවල් ලංකා ජර්නීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2014 ජූලි මස 11 වැනි දින ස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 99668
සංස්ථාගත කිරීමේ දිනය : 2014 ජූලි මස 11
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 1630/4, එස්. ඩබ්. පෙරේරා මාවත, කොටා පාර, රාජගිරිය,

සමාගමේ ලේකම්වරු.

06- 826

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ කලින් නම : ගැලක්සිකෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 90864
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 160/47, පූර්වාරාම පාර, කොළඹ 05
සමාගමේ අළුත් නම : පැරකුම් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලේකම්.

06-597

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සැට් නැම් ලෙෂර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 105719
දිනය : 2015.05.20
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සීමැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී./(2) 2013/311

06-602

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සල්කා පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පෞද්ගලික සීමිත සමාගමක් ලෙස 2015.03.04 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සල්කා පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104260
ලියාපදිංචි ලිපිනය : අංක 205/1, බංගලා පාර, මනම්බොඩ, උකුවෙල, මාතලේ.

අධ්‍යක්ෂක මණ්ඩලය.

06-617

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කර ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : අනුරාධා ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
වෙනස් කළ පසු නාමය : අනුරාධා ඉම්පෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 1763
ලියාපදිංචි කාර්යාලය : අංක 181, මීගමුව පාර, පිළියන්දල
ලියාපදිංචි දිනය : 2015.04.24

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-618

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : කෝපි කඩේ (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2015.05.25
3. සමාගමේ අංකය : පීවී 105835
4. ලියාපදිංචි ලිපිනය : අංක 02, ඇඩම්ස් ඇවනිව්, කොළඹ 04.

ලේකම්.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

06-621

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ක්ලීන් පාර්ක් ජාඇල (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2015.05.25
3. සමාගමේ අංකය : පී වී 105821
4. ලියාපදිංචි ලිපිනය : අංක 275, මීගමුව පාර, ජාඇල.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

06-622

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ක්ලීන් පාර්ක් ඔඩෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2015.05.25
3. සමාගමේ අංකය : පී වී 105823
4. ලියාපදිංචි ලිපිනය : අංක 37, වාසල පාර, දෙහිවල.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

06-623

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ක්ලීන් පාර්ක් ක්‍රෙස්කැට් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2015.05.25
3. සමාගමේ අංකය : පී වී 105827
4. ලියාපදිංචි ලිපිනය : අංක 37, වාසල පාර, දෙහිවල.

එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

06-624

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තිය අනුව, පහත සඳහන් සමාගමේ ව්‍යාපාර නාමය වෙනස් කළ බවට කරන දැනුම්දීම.

පෙර නාමය : සෙන්ට්‍රල් රිසර්වේෂන් සිස්ටම්ස් (පීවීටී) එල්ටීඩී
නව නාමය : ට්‍රැවල්පුර (පීවීටී) එල්ටීඩී
නම වෙනස් කළ දිනය : 2015 මැයි මස 21 වැනි දින
සමාගම් ලියාපදිංචි අංකය : PV 76523
ලියාපදිංචි ලිපිනය : අංක 425/7, 5 වැනි පටුමග, කෝට්ටේ පාර, වැලිකඩ, රාජගිරිය.

ගයත්‍රි වික්‍රමාරච්චි,
සමාගම් ලේකම්.

06-830

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි

01. නම : සී ටී එස් ලංකා ටුවර්ස් ඇන්ඩ් කොමර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : 104155
දිනය : 2015.03.06
ලිපිනය : අංක 171, කඩුවෙල පාර, ගණහේන, බත්තරමුල්ල.

02. නම : විට්රො කොමියුනිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : 104084
දිනය : 2015.02.25
ලිපිනය : අංක 428/බී, අතුරුගිරිය පාර, හෝකන්දර උතුර, හෝකන්දර

03. නම : ඩී ඒ පී ජී ට්‍රේඩිං ප්‍රයිවට් (ලිමිටඩ්)
ලියාපදිංචි අංක : 105516
දිනය : 2015.05.11
ලිපිනය : අංක 1046/3 බී, පොතුඅරාව පාර, මාලඹේ

04. නම : ෂාලම් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංක : 100318
දිනය : 2014.08.18
ලිපිනය : අංක 5/1, අවිස්සාවේල්ල පාර, මුල්ලේරියාව දකුණ, අංගොඩ.

සමාගම් ලේකම්වරු.

06-629

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

සමාගමේ නම : වයිට් ලෝටස් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105974
ලියාපදිංචි කළ දිනය : 2015 මැයි මස 29
ලියාපදිංචි කාර්යාලය : 293/5, වික්ටරි ගාර්ඩින්ස්, ආචාර්ය සී. වී. එස්. කොරෙයා මාවත, තලවතුගොඩ පාර, හෝකන්දර.

06-631

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්

සමාගමේ නම : ඒෂියා නිවුස්පේපර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105954
ලියාපදිංචි කළ දිනය : 2015 ජුනි මස 1 වැනිදා
ලියාපදිංචි කාර්යාලය : 293/5, වික්ටරි ගාර්ඩින්ස්, ආචාර්ය සී. වී. එස්. කොරෙයා මාවත, තලවතුගොඩ පාර, හෝකන්දර.

06-632

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : එම්ටෙක් සොෆ්ට්වේයාර් සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 105015
ලියාපදිංචි දිනය : 2015 අප්‍රේල් මස 08
ලිපිනය : දෙවන මහල, බර්නාඩ් බිස්නස් පාර්ක්, අංක 106, දුටුගැමුණු මාවත, දෙහිවල.

සමාගම් ලේකම්වරු.

06-635

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව 2015.05.28 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඩිඕලා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105921
ලියාපදිංචි ලිපිනය : 112/8 සී, කන්දවත්ත ටෙරස්, කොළඹ 05.

අධ්‍යක්ෂ.

06-639

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව 2016 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් 2015.09.08 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් මගින් ඉදිරිපත් කළ යුතු ය;

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය;

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු ය.

*(ඈ)* ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :-

(1) ටෙන්ඩර් පත්‍රය මුලුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව, ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය;

(3) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය;

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝරම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු යි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2015.10.31 වැනි දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකි ය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2015 ජූනි මස 01 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*විදේශ මත්පැන් තැබෑරුම්*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| අංක 01-නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2015.09.08 | පෙ.ව. 10.30 | රු. 5000 |

06-607

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මහරගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2010.12.22 දිනැති සහ අංක 4503, දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙල්ටා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු වශයෙන් හා කනත්තගොඩ විතාරන්ගේ සුනිල් ප්‍රදීප් සහ යහම්පත් අච්චිගේ දොන් චන්ද්‍රිකා උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ ජූලි මස 28 වැනි දින ප. ව. 3.00 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පමුණුව ග්‍රාමයේ පිහිටි පමුණුව පාරේ වරිපනම් අංක 74 ඒ දරන මදටියගහවත්ත සහ අලුබෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. සී. ඩයස් විසින් පිළියෙල කරන ලද 1972 අප්‍රේල් මස 05 වැනි දින අංක 905 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 3 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස. විශාලත්වය පර්චස් දහයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 10.2)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.24 දින රජයේ *ගැසට් පත්‍රය* හා 2014.10.30 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මහරගම නගරයේ සිට පමුණුව පාරේ කිලෝමීටර් 1.4ක් පමණ ගිය විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු 2 1/2%ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478, 0112 - 337707
ෆැක්ස් අංකය : 0112- 337707.

06-753

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - අතුරුගිරිය ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2012.12.12 දිනැති සහ අංක 5229 සහ 2013.06.11 දින සහතික කරන ලද්දාවූ ද, අංක 5385 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පොලගේ යොහාන් ගනේෂ් ෆොන්සේකා සහ ප්‍රියංගි මේකලා සුදිසි අරංගල යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිනිස පහත සඳහන් දේපළ 2015ක් වූ ජූලි මස 28 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල නගර සභා සීමාව තුළ ඕරුවල ග්‍රාම නිලධාරි වසමේ 490 තුළ අතුරුගිරිය ගොඩගමෙහි පිහිටි වරිපනම් අංක 279 දරන කහටගහවත්ත හෙවත් ඉඩම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එස්. ආර්. පෙරේරා විසින් 2012.02.05 වැනි දින සාදන ලද අංක 1180 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතරයි දශම පහයි (අ. 0, රූ. 2, පර්. 4.50) වන ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2015.03.20 වැනි දින ඩේලි මිරර්, තිනක්කුරල් සහ ලක්බිම පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - අතුරුගිරිය ඔරලෝසු කණුව හන්දියේ සිට මීගොඩ පාරේ, මීටර් 500ක් පමණ ගමන් කළ විට අතුරුගිරිය පොලිසිය ඉදිරිපිට කොළඹ මීගොඩ පාරට මුහුණ ලා එම පාරේ වම් අත පැත්තේ ඇති දේපළට ළඟා විය හැකි ය. එය ගොඩගම පාරේ අංක 284/4 සී. ස වින්රෝ ඇපරල් ලංකා (පුද්ගලික) ලෙස හැඳින්වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 337707.

06-754

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කඩවත ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ කැලණිය උප කාර්යාල සීමාවේ දළුගම නුවර පාරේ වරිපනම් අංක 958 ඒ, 962 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමේ භාගයකින් කොටසක් මැන බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 මැයි 09 වැනි දින සාදන ලද අංක 1056 දරන පිඹුරේ ලොට් 1 දරන ප්‍රමාණය : පර්චස් තිස්පහක් (අ. 0 රූ. 0 පර්. 35) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ කැලණිය උප කාර්යාල සීමාවේ දළුගම නුවර පාරේ වරිපනම් අංක 962 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 මැයි 09 වැනි දින සාදන ලද අංක 1056 දරන පිඹුරේ ලොට් 2 දරන ප්‍රමාණය පර්චස් දාසයයි දශම පහ (අ. 0 රූ. 0 පර්. 16.5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ කැලණිය උප කාර්යාල සීමාවේ දළුගම හිඹුටුවැල්ගොඩ ගමේ පිහිටි උරුල්ලෑවෙල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 නොවැම්බර් මස 28 වැනි දින සාදන ලද අංක 1094 දරන පිඹුරේ ලොට් 1, ප්‍රමාණය පර්චස් දාහතරයි දශම හතයි තුනයි (අ. 0 රූ. 0 පර්. 14.73) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ මාධවී පැතුම් යන නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අතාවුද ආරච්චිගේ දොන් සතිස් ජනක ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කර ඇත.

ඉහත සඳහන් දෙවන උපලේඛනයේ සඳහන් දේපළ අතාවුද ආරච්චිගේ දොන් සතිස් ජනක ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කර ඇත.

ඉහත සඳහන් තුන්වන උපලේඛනයේ සඳහන් දේපළ මාධවී පැතුම් යන ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අතාවුද ආරච්චිගේ දොන් සතිස් ජනක හෙවත් අතාවුද ආරච්චිගේ දොන් සතිස් ජනක අතාවුද ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පීඑල්සී ට උකස් කර ඇත.

වර්ෂ 2015ක් වූ ජූලි මස 20 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* 2014.12.30 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.06.26 *රජයේ ගැසට් පත්‍රය* ද. 2015.06.30 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම*.- කඩවත නගර මධ්‍යයේ සිට කොළඹ නුවර ප්‍රධාන පාරේ (ඒ 1) කි. මී. 7.5ක් පමණ පැලියගොඩ දෙසට ගමන් කරන විට 6 වන සැතපුම් කණුව හමුවේ. අදාල දේපළ වම්අත පැත්තේ පාරට යාබදව පිහිටා ඇත. (සේදර ගොඩනැගිල්ල ආසන්නව පිහිටා ඇත)

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද, (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කඩවත ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 143 බී, නුවර පාර,
කඩවත.
දුරකථන අංක : 011 - 2921460
011 - 2921456 - 7
ෆැක්ස් : 011 - 2921455

06-703

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - නුගේගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 2004 ඔක්තෝබර් මස 30 වැනි දින සාදන ලද දින දරන පිඹුරු අංක 5020 හි ලොට් අංක 02 (මෙය බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් 1990 සැප්තැම්බර් මස 15 වැනි දින සාදන ලද පිඹුරු අංක 3727 හි දැක්වෙන ලොට් අංක 02 හි නැවත මිනුම්ගත කිරීමකි.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මහරගම මහ නගර සභා සීමාවන් තුළ උඩහමුල්ලේ වැටකේයාවල පාරේ පිහිටි ගොරකගහ කුඹුර හෙවත් වැටකේගහ කුඹුර නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ. 0 රූ. 0 පර්. 18.85) හෝ හෙක්ටයාර් 0.0477

ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ සහ නානායක්කාරවසම් පුල්ලේ එදරලච්චිගේ ලක්මිණී ඩයස් ගුණවර්ධන ණයකරුවන් ලෙස ද ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ උකස්කරු ලෙස ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2015 ක්වූ ජූලි මස 17 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.07.05 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.06.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2015.06.29 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- ශ්‍රී ජයවර්ධනපුර රෝහල් හංදියේ සිට පන්සල පාරේ ගියවිට වමට හැරුණු විට බේකරි හංදිය හමුවේ. එම පාරේ කි. මී. 1/4ක් පමණ ගිය පසු වමට ඇති කුඹුක්ගහපොකුණ පාරේ අඩි 20ක් පළල තාර පාර හමුවේ. එම පාරේ යාර 50ක් පමණ ගිය විට වමට ඇති වැටකේයාවල පාරේ යාර 30ක් පමණ ගියවිට අදාල දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යː-

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 100, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
දුරකථන අංක : 011 - 2810942-3
ෆැක්ස් අංකය : 011 - 2827772

06-702 ඔ

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - කඩවත ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමුවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභාවේ කැළණිය උප කාර්යාල සීමාවේ දළුගම නුවර පාරේ වරිපනම් අංක 958 ඒ, 962 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමේ භාගයකින් කොටසක් මැන බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 මැයි මස 09 වැනි දින සාදන ලද අංක 1056 දරන පිඹුරේ ලොට් 1 දරන - ප්‍රමාණය පර්චස් තිස්පහක් (අ. 0 රූ. 0 පර්. 35) විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

**දෙවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභාවේ කැළණිය උප කාර්යාල සීමාවේ දළුගම නුවර පාරේ වරිපනම් අංක 962 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 මැයි 09 වැනි දින සාදන ලද අංක 1056 දරන පිඹුරේ ලොට් 2 දරන ප්‍රමාණය පර්චස් දහසයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 16.5) විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### තුන්වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ කැලණිය උප කාර්යාල සීමාවේ දළුගම හිඹුටුවැල්ගොඩ ගමේ පිහිටි උරුල්ලෑවෙල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් 2000 නොවැම්බර් මස 28 වැනි දින සාදන ලද අංක 1094 දරන පිඹුරේ ලොට් 1 ප්‍රමාණය පර්චස් දහහතරයි දශම හතයි තුනක් (අ. 0 රූ. 0 පර්. 14.73) විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

කැලණිය දලුගම නුවර පාරේ හිඹුටුවැල්ගොඩ අංක 624 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ මාධවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ අතාවුද ආරච්චිගේ දොන් සතිස් ජනක උකස්කරු හැටියටත් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කරන ලද ඉහත සඳහන් 1, 2 සහ 3 උපලේඛනවල අයත් දේපළ වර්ෂ 2015ක් වූ ජූලි මස 20 වැනි දින පෙ. ව. 11.15 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.12.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2014.12.31 වැනි දින ලක්බිම සහ වීරකේසරී පුවත්පත් ද 2015.01.01 ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.06.26 රජයේ *ගැසට් පත්‍රය* ද , ලක්බිම ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම.* - කඩවත නගර මධ්‍යයේ සිට කොළඹ නුවර ප්‍රධාන පාරේ (ඒ 1) කි. මී. 7.5ක් පමණ පෑලියගොඩ දෙසට ගමන් කරන විට 6 වැනි සැතපුම් කණුව හමුවේ. අදාල දේපළ වම්අත පැත්තේ පාරට යාබදව පිහිටා ඇත. (සේදර ගොඩනැගිල්ල ආසන්නව පිහිටා ඇත).

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද(VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ කඩවත ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,<br>
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,<br>
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12<br>
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393<br>
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,<br>
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,<br>
අංක 143 බී, නුවර පාර,<br>
කඩවත.<br>
දුරකථන අංක : 011 - 2921460<br>
011- 2921456 -7<br>
ෆැක්ස් අංක : 011 - 2921455

06-701